# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,879/15 — 1969 නොවැම්බර් 29 වැනි සෙනසුරාද — 1969.11.29**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**එල්.ඩී.—බී. 16/54.**

**සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත**

**7 වන වගන්තිය යටතේ ආඥාව**

(129 වැනි අධිකාරය වන) සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 7 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු හා රැකීරක්ෂා ඇමති, මොහමඩ් හනීෆා මොහමඩ් වන මම, 1965 අංක 17 දරන නිවාඩු ආඥපනතෙහි අර්ථානුකූලව නිවාඩු දින වන්නාවූ ද, මෙයට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන්කොට ඇත්තාවූ ද දවස් ඉහතකී වගන්තියේ කාර්යයන් සඳහා නිවාඩු දවස් වශයෙන් මෙම ආඥාවෙන් ප්‍රකාශ කරමි.

එම්. එච්. මොහොමඩ්,
කම්කරු හා රැකීරක්ෂා ඇමති.

1969 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

(1) ජාතික වීරවරයින් සිහිකිරීමේ දිනය වන 1970 ජනවාරි 1 වැනි දින ;

(2) සිංහල වෙසක් මාසයේ පුන් පොහෝ දිනයට ඉක්බිතිවම එළඹෙන දිනය වන 1970 මැයි මස 21 වැනි දින.

11–942


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

71 A—ජේ 9015—11,600 (69/